# අධිකරණ අමාත්‍යාංශය

## 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වැනි වගන්තිය යටතේ හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම - 2021

මෙහි උපලේඛනයේ දැක්වෙන හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසවල පුරප්පාඩු වී ඇති හදිසි මරණ පරීක්ෂක තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර “ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12” ලිපිනය වෙත 2021.02.26 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ “හදිසි මරණ පරීක්ෂක තනතුර - .................................. දිස්ත්‍රික්කය” යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් තැපැල් සේවාවන්හි යම් ප්‍රමාදයක් සිදු විය හැකි බැවින් www.moj.gov.lk අමාත්‍යාංශයීය වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත අයදුම්පත්‍රය ද නිසි පරිදි සම්පූර්ණ කල යුතුය.

04. මෙම තනතුර රජයේ ස්ථිර තනතුරක් නොවේ. මෙම තනතුරට පත් කරනු ලබන දින සිට වයස අවුරුදු 60 දක්වා බලපවත්වන පරිදි පත් කරනු ලබන අතර, ඉන් පසුව අදාළ අධිකරණ බලප්‍රදේශයේ මහේස්ත්‍රාත්තුමාගේ නිර්දේශය හා පොලිස් ස්ථානාධිපතිගේ වාර්තාවක් සහ වෛද්‍ය නිර්දේශ සලකා බලා වයස අවුරුදු 65 දක්වා සේවය දීර්ඝ කරනු ලබන අතර, වයස අවුරුදු 65 න් පසුව එම තනතුර දැරීමේ උපරිම වයස් සීමාව මත අවුරුදු 70 දක්වා දීර්ඝ කරනු ලැබිය හැකිය. කෙසේ වුවද, ඕනෑම අවස්ථාවක හදිසි මරණ පරීක්ෂකවරයකු හේතු දක්වා අධිකරණ අමාත්‍යතුමා විසින් සේවයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

05. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ විධිවිධානවලට අනුකූලව හදිසි මරණ පරීක්ෂකවරුන් සම්බන්ධ සියලුම කාර්යයන් පත්වීම්ලාභියා විසින් ඉටුකළ යුතු වේ.

06. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එසේ වුවද, එක් මරණ පරීක්ෂණයක් සඳහා රු.1000/- ක ගාස්තුවක්ද, මරණ පරීක්ෂකවරුන් සඳහා අනුමත ගමන් වියදම් හා සංයුක්ත දීමනා ද ගෙවනු ලැබේ.

07. පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති අයවලුන්ට පමණක් මේ සඳහා අයදුම් කළ හැක.

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

II. පත්වීම අපේක්ෂා කරන හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අවුරුදු 30 ට නොඅඩු වියයුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

IV. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් 03කින් සාමාර්ථ ලබා තිබීම. (මෙහිදී විද්‍යා විෂයයන්ගෙන් සාමාර්ථය ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

V. මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි අයෙකු විය යුතුය.

VI. හදිසි මරණ පරීක්ෂක (මුස්ලිම්) තනතුර සඳහා අයදුම් කරනු ලබන අයදුම්කරුවන් හට දෙමළ භාෂාවෙන් කතා කිරීමේ, ලිවීමේ හා කියවීමේ හැකියාව තිබිය යුතුය.

08. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට රජයේ, පළාත් සභා අරමුදලකින් හෝ පළාත් පාලන ආයතනයක අරමුදලකින් වැටුපක් හෝ දීමනාවක් ලබන තැනැත්තන්ද, රාජ්‍ය සංස්ථා වල සහ සමූපකාර සමිතිවල සේවකයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද, පළාත් සභා මන්ත්‍රීවරුන් හෝ පළාත් පාලන ආයතනවල සභිකයන්ද මෙම තනතුර සඳහා අයදුම් කිරීමට නුසුදුස්සෝ වෙති.

09. අයදුම්පත්‍රය සමඟ පහත I, II හා III ට අදාල ලේඛනවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය. තවද, සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර, පහත දැක්වෙන ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

I. උප්පැන්න සහතිකය
II. අධ්‍යාපන සහතික
III. ජාතික හැඳුනුම්පත
IV. ස්ථිර පදිංචිය සනාථ කෙරෙන ග්‍රාම නිලධාරී සහතිකය
V. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්
VI. අතිරේක සුදුසුකම් තහවුරු කිරීම සඳහා වෙනත් සහතික තිබේ නම් එම සහතික
VII. විශ්‍රාමික අයදුම්කරුවන් විසින් විශ්‍රාම ගත් දිනය සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි

10. සියලුම අයදුම්පත්‍ර පහත සඳහන් ආකෘතියට අනුකූලව පැහැදිලි අකුරින් සම්පූර්ණ කර තිබිය යුතුය. අවශ්‍ය තොරතුරු සියල්ල ඇතුළත් නොකර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී සුදුසුකම් පිළිබඳව ඉතා සැලකිලිමත්ව නිවැරදි වූ තොරතුරු ඇතුළත් කළ යුතුය. අවශ්‍ය සුදුසුකම් නොමැතිව හෝ ඉහත (08) ඡේදයේ සඳහන් ගණයට අයත් කෙනෙකු වුවද, ඉල්ලුම්කර සම්මුඛ පරීක්ෂණයෙන් ද පසු පත්වීම් දීමෙන් අනතුරුව නිත්‍ය තත්වය ඔප්පු වුවහොත් එම පත්වීම් වහාම අවලංගු කරනු ලැබේ.

12. තවද, හදිසි මරණ පරීක්ෂකවරයකු වශයෙන් පත්කරනු ලැබීමෙන් පසුව ඉහත 08 ඡේදයේ සඳහන් තනතුරකට පත්වුවහොත් එසේ පත්වීම ලද දින සිට හදිසි මරණ පරීක්ෂක තනතුරේ පත්වීම අහෝසි වේ.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය

2021.02.01 වන දින
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේදීය.